

**ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?**

# ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

## නිපුණතා පූර්ණ තරුණ තරුණියන් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ රැකියා අවස්ථා

දිවයින පුරා ශාඛා 272 ක් සහ 3000 ට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා සුදුසුකම් සහිත නිපුණතා පූර්ණ සහ කාර්යශූර තරුණ තරුණියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පුහුණු බැංකු සහකාර

### I). අවශ්‍ය සුදුසුකම්

මව් භාෂාව (සිංහල / දෙමළ) සහ ගණිතය ඇතුළුව සම්මාන පහක් (05) සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් හයක් (06) එකවර සමත්ව තිබීම,

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) එකවර සමත් වී තිබීම.

අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සහ සාමාන්‍ය දැනුම සමත් වී තිබීම. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා තම මව් භාෂාවට අමතරව අනෙකුත් භාෂාවකින් කටයුතු කිරීමේ හැකියාව අමතර සුදුසුකම් වේ.

තව ද ග්‍රාමීය හා ප්‍රජාමූල කටයුතුවලදී සක්‍රියව දායක වී ඇති තරුණ තරුණියන් කෙරෙහි සම්මුඛ පරීක්ෂණයේදී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ඇත.

### II). වයස

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.05.18 දිනට හෝ ඊට පෙර හා 2001.05.18 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත).

### III). අයදුම්පත් යොමු කිරීම

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams / E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2025 මැයි මස 19 වැනි දින පෙ.ව. 9.00 විවෘත වන අතර, 2025 ජූනි මස 19 වැනි දින රාත්‍රී 9.00 ට අවසන් වේ.

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මාදිලි පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරනලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### IV). විභාග ගාස්තු ගෙවීම

01. විභාග ගාස්තු රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.
    - I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
    - II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Banking)
    - III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
    - IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

**සටහන්**

- අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.
- ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.
- ඇ) විභාග සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

02. ඉහත රු. 600/- ට අමතරව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ විභාග ගාස්තු බැරකිරීමේ ගිණුම් අංක 13401200020 1 යටතේ ඕනෑම ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛාවකින් පමණක් බැංකුවේ විභාග ගාස්තු වශයෙන් රු. 1,000/- ක මුදලක් තැන්පත් කළ යුතු වේ. මුදල් තැන්පත් කිරීමෙන් පසු ඔබ වෙත ලබා දෙන රිසිට්පත ඔබ ළඟ සුරක්ෂිතව තබා ගත යුතුය.

### V). තෝරාගැනීමේ පටිපාටිය

ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලිඛිත තරඟ විභාගයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ. ලිඛිත තරඟ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ. තරඟ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විෂය | කාලය | මාධ්‍යය | ලකුණු | සමත් ලකුණ |
|---|---|---|---|---|
| විශ්ලේෂණ දක්ෂතා / බුද්ධි පරීක්ෂණය | පැය 01 | සිංහල / දෙමළ / ඉංග්‍රීසි | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | පැය 01 | සිංහල / දෙමළ / ඉංග්‍රීසි | 100 | 40 |

**සටහන**

ඉහත විභාගයෙන් සමත්වන සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. දිස්ත්‍රික් පදනම මත අපේක්ෂකයින් තෝරාගනු ලබන අතර, 2025.06.19 දිනට ඔවුන් එම දිස්ත්‍රික්කයේ අවම වශයෙන් ආසන්න වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

### VI). පත්වීම් ලබා දීම හා සේවා කොන්දේසි

මෙම පත්වීම වසර 02 ක පුහුණු කාලයකට යටත් වේ. වසර 2 ක පුහුණු කාලයෙන් පසුව සුදුසුකම් ලබන්නන් එම තනතුරේ වසර 01 ක පරිවාස කාලයකට යටත් වේ. පුහුණු කාල සීමාව තුළ කාර්යය සාධන ඇගයීමට යටත් වන අතර, තනතුර ස්ථිර කිරීමේදී ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව සමත් වීම හෝ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සලකා බලනු ලැබේ.

### VII). වැටුප් පරිමාණය

පුහුණු කාලය තුළ පළමු වසරේදී රු. 55,000/- ක මාසික ස්ථාවර දීමනාවක් ගෙවනු ලබන අතර, දෙවන වසරේදී රු. 70,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සාර්ථක ලෙස වසර දෙකක පුහුණු කාලය නිමකරන්නන් බැංකු සහකාර 5 - I ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, ආරම්භක මූලික වැටුප් පරිමාණය (රු. 64,025-400 X 20-72,025) පරිදි වේ. මීට අමතරව බැංකුවේ අනෙකුත් දීමනාවන් සඳහා ද හිමිකම් ලබයි.

### VIII). ප්‍රවේශ පත්‍ර

පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් හෝ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දක්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම් එම විස්තරය සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත (Screen Shot) විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

විමසීම් සඳහා ආයතනික විභාග සංවිධාන ශාඛාව දු. ක. 0112785230, ෆැක්ස් : 0112784232

### IX). අනන්‍යතාව තහවුරු කිරීම

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- I. ජාතික හැඳුනුම්පත
- II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
- III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සිංහල / දෙමළ / ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑම ආකාරයක බලපෑමක් හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමක් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට නුසුදුසුකමක් වේ.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරි,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk

tamilguru.lk